# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,052 - 2017 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 3096 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 3165 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජනවාරි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජනවාරි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3093 - B 812238— 5,403 (2017/12)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිෂ්‍යභට නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිෂ්‍යභට නිලධාරීන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා සුදුසුකම් සපුරා ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

(අ) විධායක අංශය
(ආ) විනයාරක්ෂක අංශය
(ඇ) සැපයුම් අංශය
(ඈ) මැරීන් බලකා අංශය
(ඉ) ඉංජිනේරු අංශය
(ඊ) විදුලි ඉංජිනේරු අංශය

3. මූලික අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් සමත්වී තිබිය යුතුය.

(ආ) පහත අංශයන් සඳහා අ. පො. ස. (උ/පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් 03ක් සමත්ව තිබිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| (1) | විධායක අංශය සඳහා | - | ජීව විද්‍යා, භෞතික විද්‍යා, රසායන විද්‍යා සහ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් අ.පො.ස. (උ/පෙළ) හදුරා තිබීම. |
| (2) | විනයාරක්ෂක/මැරීන් බලකා අංශය සඳහා | - | වාණිජ, තාක්ෂණික හෝ කලා විෂය ධාරාවන්ගෙන් අ. පො. ස. (උ/පෙළ) හදුරා තිබීම. |
| (3) | සැපයුම් අංශය සඳහා | - | වාණිජ විෂයධාරාවෙන් අ. පො. ස. (උ/පෙළ) හදුරා තිබීම. |
| (4) | ඉංජිනේරු අංශය | - | භෞතික විද්‍යා, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් අ. පො. ස. (උ. පෙළ) හදුරා තිබීම. |
| (5) | විදුලි ඉංජිනේරු අංශය | | |

(ඇ) අ. පො. ස. (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලකුණු 30ට නොඅඩුව ලබා තිබිය යුතුය.

(ඈ) අ. පො. ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵලවලට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ලබා තිබීම. (විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.)

4. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදවට බැඳීමට අයදුම්කරුවන් පහත සඳහන් මූලික සුදුසුකම් අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය.

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | වයස | : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි. |
| (ඇ) | උස | : සෙ. මී. 168 (අඩි 5 අඟල් 7)ට නොඅඩු විය යුතුයි. (විනයාරක්ෂක අංශය සඳහා සෙ. මී. 171 (අඩි 5 අඟල් 8)ට නොඅඩු විය යුතුයි. |
| (ඈ) | බර | : කි. ග්‍රෑ. 52ට නොඅඩු විය යුතුයි. |
| (ඉ) | පපුව | : සෙ. මී. 81 (අඟල් 32ට) නොඅඩු විය යුතුයි. |
| (ඊ) | වර්ණ දෘෂ්ටිය | : එස්ටීඩී II. |
| (උ) | දෘෂ්ටි තීක්ෂණත්වය | : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව) |
| (ඌ) | සිවිල් තත්වය | : අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ශිෂ්‍යභට නිලධාරියෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කල දින සිට වසරක් ගතවන තුරු විවාහවීමට අවසර දෙනු නොලැබේ. |

5. *සේවා කොන්දේසි :*

(අ) අපේක්ෂකයින් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිෂ්‍යභට නිලධාරින් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. බඳවා ගැනීමේ අංශයන්ට අදළ මූලික පුහුණුව සාර්ථකව නිම කරන ශිෂ්‍යභට නිලධාරීන් වැඩ බලන උප ලුතිනන් නිලයේ අධිකාරයට පත් කරනු ලබයි.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ශිෂ්‍යභට නිලධාරීන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) සියලුම අපේක්ෂකයින් දැනට පවතින නාවික හමුදා පනත, නාවික හමුද නියෝග සහ නාවික හමුද පනතේ සංදේශ මගින් බලගන්වනු ලබන නීති හා උපදෙස්වලට යටත් විය යුතු අතර, මින් මතුවට පනවනු ලබන නීති හා උපදෙස්වලට යටත්වීමට බැඳී සිටිය යුතුයි.

(ඈ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළදී යම් ශිෂ්‍යභට නිලධාරීන් හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා නාවික හමුද ක්‍රියා පිළිවෙතට අනුකූලව ලිඛිතව අනුමැතිය ලබාගත යුතු අතර, ශ්‍රී ලංකා ජනරජය මගින් එම ශිෂ්‍යභට නිලධාරයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලු වියදම් එම ශිෂ්‍යභට නිලධාරියාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(ඉ) පුහුණුව ලබන කාල සීමාව තුළ ඕනෑම අවස්ථාව දී යම් ශිෂ්‍යභට නිලධාරියෙකු විනය විරෝධි නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී අදළ ශිෂභට නිලධාරියාගේ ඇපකරුවන්/භාරකරුවන් විසින් එහෙත් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදවට ආපසු ගෙවීමට එකග වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයට ඇතුළත් විය යුතුයි.

(ඊ) පුහුණු කාලය තුළදී සිදුවන අනතුරුවලදී සහ පූර්ණ කාලීන දුබලතාවලදී දැනට නාවික හමුදවේ ක්‍රියාත්මක රක්ෂණය මගින් ආවරණය සලසන අතර, ඒ සඳහා විශේෂ වන්දි ගෙවීමකට හෝ වගකීමකට නාවික හමුදව බැඳී නොමැත.

6. *වැටුප් හා දීමනා :*

2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමණාකරන සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව

| | | | |
|---|---|---|---|
| අ. | මූලික වැටුප | - | රු. 22,333.00 |
| ආ. | ජීවන වියදම් දීමනාව | - | රු. 7,800.00 |
| ඇ. | නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - | රු. 255.00 |
| ඈ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - | මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඉ. | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | | මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| ඊ. | අනෙකුත් දීමනා | - | විශේෂ දීමනාව රු. 1,000 0 |
| | | - | විශේෂ අමතර දීමනාව රු. 3,000 0 |
| උ. | සුදුසුකම් වේතනය | - | රු. 637.50 |

**සටහන.**-ශිෂ්‍යභට නිලධාරියාගේ මූලික වැටුප 2020.01.01 දිනට රු. 32,380.00 වන අතර 2016.01.01 වන දින පහත පරිදි මූලික වැටුප වාර්ෂිකව සංශෝධනය වේ.

| | | | | |
|---|---|---|---|---|
| 2016.01.01 | - | රු. 18,984.00 | ගැළපුම් දීමනාව | රු. 9,778.00 |
| 2017.01.01 | - | රු. 22,333.00 | ගැළපුම් දීමනාව | රු. 6,429.00 |
| 2018.01.01 | - | රු. 25,682.00 | ගැළපුම් දීමනාව | රු. 3,080.00 |
| 2019.01.01 | - | රු. 29,031.00 | නොමැත | |
| 2020.01.01 | - | රු. 32,380.00 | නොමැත | |

7. පුහුණුව ලබන කාලසීමාවේ දී හා ඉන්පසුව හිමිවන පහසුකම්, දීමනා සහ වරප්‍රසාද :

(*අ*) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කලත්‍රයාට සහ ළමයින්ට) හිමිවනු ලැබේ.

(*ආ*) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට කඳවුරේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ. (නාවික හමුද බස්රථ සේවා ක්‍රියාත්මක නොවන ප්‍රදේශ සඳහා)

(*ඇ*) නිල ඇඳුම් සහ ඊට අදල අනෙකුත් අයිතමයන් නොමිලයේ සපයනු ලැබේ.

(*ඈ*) නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) බඳවා ගනු ලබන අපේක්ෂකයින් හට ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

(ඊ) විවාහක නිලධාරින් සඳහා විවාහක නිවාසයන්හි පවතින පුරප්පාඩු මත විවාහක නිවාස අයදුම් කල හැකි අතර, එසේ වාසය නොකරන විවාහක නිලධාරීන්ට රු. 1,600 සිට රු. 4,250 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

8. අයදුම්කරුවන්ට උපදෙස් :

(අ) අ. පො. ස. (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකා නොලබන අතර, ක්‍රීඩා අංශයේ තනි තරග වල දී ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දක්වා ඇති දක්ෂතාවයන් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියේදී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) ඉහත අනු අංක 3 සහ 4 ඡේදයන්හි සඳහන් මූලික සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) බඳවා ගනු ලබන අපේක්ෂකයින්ට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට අනුබද්ධිත උපාධි පාඨමාලාවන් හෝ දේශීය/විදේශීය උපාධි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව හිමිවනු ඇත.

(ඈ) යම් අයදුම්කරුවෙකුගේ උස/පපුව නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

(ඉ) තෝරා ගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝගයන් සහ ව්‍යවස්ථාව පිළිපැදිය යුතුවේ.

(ඊ) පහත දක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2018 පෙබරවාරි මස 05 වැනි දින දහවල් 12.00 ට ප්‍රථම ලැබෙන සේ ''ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්), නාවික හමුද මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ '' යන ලිපිනයට ලියාපදංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙළවරේ ''ශිෂ්‍යභට නිළධාරි තනතුර'' යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූඅයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා www. navy. lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-2215154 මගින් ලබාගත හැක.

(උ) ප්‍රතික්ෂේපිත අයදුම්පත් පිළිබඳව දැනුම්දීමක් සිදු කරනු නොලැබේ. තැපෑලේදී යම් අයදුම්පත්‍රයක් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලද බවට දැනුම්දීමක් සිදු කරනු නොලබයි.

(ඌ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය :-

(එ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලි වල මුල්පිටපත් ඉදිරිපත් කල යුතුය. :-

(1) උප්පැන්න සහතිකය සහ සහතික කරන ලද ඡායාස්ථිතික පිටපතක්,
(2) අයදුම් කර ඇති අංශයන් වලට අදාල අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික,
(3) පාසල් හැරයාමේ සහතිකය,
(4) මාස 06ක් ඇතුලත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය,
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පලපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,
(6) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පති තුමාගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.
(7) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික

(8) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත්කළ යුතුයි.

(ඒ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඔ) සහතික පත්‍ර සහ ලියකියවිලිවල මුල් පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් නොකළ යුතු අතර තැපැල් මගින් ඉදිරිපත් කරන මුල් පිටපත්වල ආරක්ෂාව පිළිබඳව නාවික හමුදාව වග කියනු නොලැබේ.

(ඕ) ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු දඬුවම් සහිතව සේවයෙන් පහකිරීමට ද යටත් වේ.

9. *බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය* :

(*අ*) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම් වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එම පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට නාවික හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, නාවික හමුදාධිපති සහ ආරක්ෂක අමාත්‍යාංශ නියෝජිතයෙකුගෙන් සමන්විත අවසාන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(*ආ*) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වීම සඳහා අවශ්‍යතා :

| *ව්‍යායාමය* | *වාර ගණන* | *කාලය (මිනිත්තු/තත්පර)* |
|---|---|---|
| මීටර් 1600 දිවීම | - | මිනිත්තු 06-08 අතර |
| Push Up | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Sit Up | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Arm Bending | 05 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Standing Board Jump | 242 සෙමී හෝ ඊට වැඩි | - |
| Rope Climbing | - | - |
| Shuttle Run | - | තත්පර 11 |

(*ඇ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

(*ඈ*) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත්වන අපේක්ෂකයින් නාවික හමුද වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(*ඉ*) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද, එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරාගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

(*ඊ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන මූලික සම්මුඛ පරීක්ෂණ වලින් අසමත් වන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

(*උ*) අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

(*ඌ*) සියලුම අයදුම්කරුවන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා නාවික හමුද මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමුකරනු ලැබේ.

10. ශ්‍රී ලංකා නාවික හමුදවට ශිෂ්‍යභට නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල නාවික හමුදධිපති සතු වන අතර, ජාතික ආරක්ෂාව, නාවික හමුදවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවන් සහ කොන්දේසි වල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදධිපති සතු වේ.

***සටහන.*** - මෙම *ගැසට් නිවේදනය* සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන අතර, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂාපාඨය බලපැවැත්විය යුතුයි.

එස්එස් රණසිංහ, ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, ඒඕඩබ්සී
වයිස් අද්මිරාල්
නාවික හමුදධිපති.

නාවික හමුද මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.

   (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. ඉල්ලුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. උපන් දිනය :————.

8. වයස අවුරුදු . . . මාස . . . දින . . . : (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට)

9. උස : . . . . . . . . . . (සෙ. මී.) පපුව . . . . . . . . (සෙ. මී.) බර . . . . . . . . (කි. ග්‍රෑ) :————.

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

11. දිස්ත්‍රික්කය :————.

12. ඡන්ද කොට්ඨාසය :————.

13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

14. දුරකථන අංකය :————.

15. විවාහක හෝ අවිවාහක බව :————.

16. ස්ත්‍රී පුරුෂ භාවය :————.

17. අධ්‍යාපනය ලැබූ පාසල :————.

18. පාසල සහ, හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ /විශ්ව විද්‍යාලයයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෙනත් : | | |

19. පාසැලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර ඃ

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා :<br>මව : | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේදී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

25. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලීම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

27. රජයේ දෙපාර්තමේන්තුවක දී හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථාද මම කියවා අවබෝධ කර ගතිමි.

__________,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :__________.

12-836

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්හට මේ සඳහා අයදුම් කළ හැක. :

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියෙන් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍ය ය.

කාතිවරයාට මසකට රුපියල් 7,500 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2018 පෙබරවාරි මස 10 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 දෙසැම්බර් මස 11 වැනි දින.
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12.

### උපලේඛනය

1. **ගම්පහ** - ගම්පහ, අත්තනගල්ල, මීරිගම සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **මොණරාගල** - මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්-කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

***1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ක්වාසිවරයෙකු පත් කිරීමේ ඉල්ලුම් පත්‍රය***

ක්වාසි බල ප්‍රදේශය : ____________________

1. මුලකුරු සමග නම : ____________________

උ. අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම : ____________________

උ. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය : ____________________

4. ලිපිනය : ____________________

5. උපන් දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

6. වයස : ____

7. ජාතිය : ____________________

8. ආගම : ____________________

9. ජා. හැ. ප. අංකය : ____________________

10. දුරකථන අංකය : ____________________

11. අධ්‍යාපන සුදුසුකම් :

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................
5. ..........................................................................................

12. වෘත්තීය සුදුසුකම් :

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................
5. ..........................................................................................

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? : ඔව් | නැත

15. විවාහක ද ? : ඔව් | නැත

16. භාර්යාව ජීවත්ව සිටී ද? : ඔව් | නැත

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපළ වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද ? : ඔව් | නැත

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : ඔව් | නැත

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? : ඔව් | නැත

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

_____________,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :__________.

සටහන :
සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

12-1032

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත් පදනම මත උප දුම්රිය ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන උප දුම්රිය ස්ථානාධිපති තනතුරු සඳහා පුරප්පාඩුව පවතින පහත සඳහන් උප දුම්රිය ස්ථානයන් වෙත මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පැඟිරිවත්ත
02. උඩහමුල්ල
03. ගොඩගම
04. අරුක්වත්ත
05. උග්ගල්ල
06. කඩුගොඩ
07. මොරකැලේ
08. ගම්මාන
09. රදැල්ල
10. තුඩැල්ල
11. අලවතුපිටිය
12. ලියනගේමුල්ල
13. සවරාණ
14. වලහපිටිය
15. ආයෝජන ප්‍රවර්ධන කලාපය
16. තලවත්තේගෙදර
17. මහලේකම් කාර්යාලය
18. තිරණාගම
19. පියදිගම
20. කුමාරකන්ද
21. මිදිගම
22. කොටාපාර
23. හොරපේ
24. ඉරුක්කුලම් පිඩ්ඩි නාගවිල්ලු
25. විජයරජදහන
26. බෝතලේ
27. හීන්දෙණිය පට්ටිගොඩ
28. කුඩහකපොල
29. තැඹිළිගල
30. කටුකුරුන්ද
31. ආනවිලුන්දව
32. පාතේගම්ගොඩ
33. සරසවි උයන
34. මහයියාව
35. උඩතලවින්න
36. එළුතුමට්ටුවාල්
37. තෙලිප්පලෙයි
38. පැරකුම් උයන
39. සෙවනපිටිය
40. පුන්ගන්කුලම්
41. නාවින්න
42. අංගම්පිටිය

01. උප දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ රාජකාරි විස්තර :
ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථාන භාරව සේවයේ යොදවනු ලබන නියෝජිතවරුන් ඒ ඒ ස්ථානයේ නවත්වනු ලබන දුම්රිය අනුව පැය 24 පුරාම ප්‍රවේශපත්‍ර අලෙවි කිරීම, පාර්සල් භාරගැනීම හා ලැබෙන පාර්සල් අයිතිකරුවන්ට භාරදීම, දවසේ එකතුවන මුදල් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරිවරයාට ප්‍රේශනය කිරීම එම ස්ථානය පිරිසිදුව තබාගැනීම හා දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් අවස්ථානුකූලව පවරනු ලබන වෙනත් රාජකාරී ද මෙම නියෝජිතවරුන්ගේ සාමාන්‍ය රාජකාරි වේ.

02. *දීමනා* : -
ස්ථිර සේවක සංඛ්‍යාවට අයත් නොවන තනතුරකි. තෝරාගනු ලබන අයවළුන්ට ඒ ඒ ස්ථානයේ ආදායම් පදනම් කරගත් කොමිස් මුදල් හා අනුමත දීමනා පමණක් ගෙවනු ලැබේ. තවද, අවම කොමිස් මුදල රු. 310 ක් වන අතර (ආදායම් අනුව කොමිස් මුදල ගණනය කළ විට ලැබෙන මුළු කොමිස් මුදල රු. 10,000 ට අඩු වන අවස්ථා වලදී රු. 10,000 ක කොමිස් මුදලක් හිමි වේ.) කොමිස් මුදලට අමතරව රු. 5,329 ක දීමනාවක් හිමි වේ.

03. අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණක් වේ. එක් අයදුම්කරුවෙකු හට තම දුර සීමාවෙහි පවතින

පුරප්පාඩු උප දුම්රිය ස්ථාන තුනක් සඳහා මනාපය අනුව අයදුම් කිරීමේ හැකියාවක් පවතින අතර විභාගයේදී උප දුම්රිය ස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් සඳහා වැඩි ලකුණු ලබා ගත්තේ නම් අයදුම්පතෙහි සඳහන් කරන ලද මනාපයේ අනුපිළිවල අනුව උප දුම්රිය ස්ථාන සඳහා පත් කිරීම සලකා බැලීම සිදු කරනු ලැබේ. යම් උපදුම්රිය ස්ථානයක් සඳහා තේරී පත්වූ පසු මනාපය පළ කරන ලද අනෙකුත් උප දුම්රිය ස්ථාන පුරප්පාඩු වුවද නැවත එම උපදුම්රිය ස්ථාන ඉල්ලුම් කිරීමට කිසිදු අයිතිවාසිකමක් නොමැති අතර එම උප දුම්රිය ස්ථාන සඳහා වන මනාපයන්ද අවලංගු කරනු ලැබේ.

04. *වයස් සීමාව* :-
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය.

05. අධ්‍යාපන සුදුසකම් :
අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් 06 කින් එකවර සමත් විය යුතු ය.

06. වෙනත් සුදුසුකම් :

I. ඉල්ලුම්කරු අදාළ උප දුම්රිය ස්ථානයේ සිට කිලෝමීටර් 20ක ඇතුළත (ඍජු දුර) ආසන්න දුර සීමාවේ වසර 05 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය අනුයුක්ත කිරීමේ ලිපිය ප්‍රදානය කිරීමට පෙර මේ බව පිළිගත හැකි ලිපිවලින් සනාථ කළ යුතු ය. (ග්‍රාම නිළධාරි සහතිකය, ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය, ඡන්ද නාම ලේඛනයේ පිටපතක් ආදී වශයෙන්) අයදුම්පතෙහි සඳහන් කරනු ලබන ලිපිනය ස්ථිර ලිපිනය විය යුතු අතර දුම්රිය ස්ථානයට ඇති ඍජු දුර ගණනය කළ යුත්තේ එම ස්ථානයේ සිට ය.

II. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

III. උස 5' 4" කට හා පපුව 32" කට නොඅඩු වීම.

IV. උප දුම්රිය ස්ථානාධිපතිවරයෙකු වශයෙන් දැනට සේවය කරනු ලබන හෝ එසේ සේවය කර සේවය අවසන් කරන ලද අයවළුන්ට මේ සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් නැත.

V. තෝරාගනු ලබන්නේ යහපත් ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් හා අක්ෂි දෘෂ්ටිය යහපත් තත්වයේ ඇති බවට තහවුරු කරගැනීමෙන් පසුව වේ. සුදුසුකම් හා හොඳ ඇස් පෙනීමක් ඇති අයෙකු වීම අනිවාර්යය වේ.

07. *තෝරා ගැනීමේ ක්‍රමය* :
දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ කුසලතාවය මත තෝරාගනු ලැබේ. ඒ අනුව පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේදී සියලුම අයදුම්කරුවන් පහත දක්වන විෂයයන් යටතේ ප්‍රශ්න පත්‍ර 02 කට පිළිතුරු සැපයිය යුතු වේ. විභාගයෙන් සුදුසුකම් ලැබීම සඳහා එක් විෂයයකින් අවම වශයෙන් 40ක් බැගින් ලකුණු ලබාගත යුතු වේ.

I. භාෂා හැකියාව :
කාලය පැය 01යි - මුළු ලකුණු 100 යි
අවබෝධය හා නිවැරදි බස හැසිරවීම පිළිබඳව විෂයානුබද්ධ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

II. බුද්ධි පරීක්ෂණය :
කාලය පැය 01 යි - මුළු ලකුණු 100 යි
ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතු ගණිත ගැටලු, භාෂා ඛණ්ඩ, වගු ගැලපීම් සටහන් පින්තූර, ප්‍රස්ථාර ඇසුරෙන් තර්කානුකූල ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව සහිත විචාර බුද්ධිය මැන බැලීමේ බහුවරණ ක්‍රමයේ ප්‍රශ්න පත්‍රයකි.

*සටහන* :

i. තරග විභාගයෙන් සුදුසුකම් ලැබූ අය අතරින් ඒ ඒ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානය අනුව, වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරු අදාළ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානය සඳහා පත්කිරීමට සලකා බැලීම පිණිස සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ii. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීමක් සිදු නොවේ.

iii. සුදුසුකම් ලැබූවන් සම ලකුණු ලබා සිටියහොත් එවැනි අවස්ථාවලදී දුම්රිය ප්‍රවේශපත්‍ර අලෙවි නියෝජිතවරයා යටතේ හෝ උප දුම්රිය ස්ථානාධිපතිවරයා යටතේ අනුමත අදේශකයෙකු වශයෙන් සේවය කර ඇති අයදුම්කරුවාට අවස්ථාව දෙනු ලැබේ. එසේ නොවන්නේ නම් අදාළ ප්‍රවේශපත්‍ර අලෙවි ස්ථානයේ සිට වඩාත් ම ආසන්න පදිංචිකරුවා තෝරාගනු ලැබේ.

iv. මෙම නිවේදනයන් ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරි සතු වේ.

v. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටක දී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි බව සලකා කටයුතු කළ යුතු ය.

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) තෝරාගනු ලබන අය විසින් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් තීරණය කරනු ලබන පරිදි හෝ අවම වශයෙන් රු. 25,000.00ක මුදලක් ආරක්ෂක ඇපයක් වශයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගේ නමට තැන්පත් කළ යුතු අතර, දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා සමග අත්සන් කරනු ලබන ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කටයුතු කළ යුතු වේ. එම ගිවිසුමේ කොන්දේසි කඩකිරීම සේවය අවසන් කිරීමට හේතුවක් වනු ඇත.

ii. මෙය කොන්ත්‍රාත් පදනමක් වන අතර, අවුරුද්දක් පාසා අදාළ ගිවිසුම අලුත් කළ යුතු ය. එසේ අලුත් නොකරනු ලබන අවස්ථාවේදී ගිවිසුම අහෝසි වනු ඇත.

iii. තෝරාගනු ලබන අයදුම්කරු තමා අනුයුක්ත කරනු ලබන ස්ථානයේ රාජකාරි පිළිබඳව දින 14 ක පුහුණුවක් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා නියම කරනු ලබන දුම්රිය ස්ථානයකින් ලබාගත යුතු වේ. මෙම පුහුණු කාලය සඳහා කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

iv. තමා වෙනුවට සහායට වැඩ කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව තමන්ට සහායකයෙකු අනුමත කරවාගත හැකි වන අතර ආදේශකවරයා වෙනුවෙන් කිසිදු දීමනාවක් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු නොලැබේ. ස්ථානයේ සම්පූර්ණ වගකීම උප දුම්රිය ස්ථානාධිපතිවරයා සතු ය.

v. පුහුණුව ලබන කාලය තුළ හෝ උපදුම්රිය ස්ථානාධිපති වශයෙන් කටයුතු කරමින් සිටින කිසියම් අවස්ථාවකදී හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ වෙනත් කිසියම් අවස්ථාවකදී හෝ අපේක්ෂකයා විසින්/ ඔහු වෙනුවෙන් ලබා දී ඇති/ සපයා ඇති තොරතුරු නිවැරදි සහ බල සහිත ඒවා නොවේ යැයි හෙළි වුවහොත් කිසිදු පූර්ව දැනුම් දීමකින් හා වන්දි ගෙවීමකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි ඔබගේ සේවය ලබාගැනීම අවසන් කරනු ලැබේ.

vi. උප දුම්රිය ස්ථානාධිපති ලෙස තෝරා ගන්නා අයකුට එම තේරීම මත දුම්රිය දෙපාර්තමේන්තුවේ කිසිදු ස්ථිර තනතුරක් ලබාදීමට දෙපාර්තමේන්තුව බැඳී නොමැත.

09. සේවා කොන්දේසි :

(I) අත්සන් කරනු ලබන ගිවිසුමේ යම් කොන්දේසියක් හෝ කීපයක් හෝ කඩකළහොත් ඔහුගේ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කරනු ලැබේ.

(II) දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා විසින් කලින් කලට පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසිවලට ද යටත් වීමට එකඟවිය යුතු ය.

10. විභාග ගාස්තු :

සියළුම අයදුම්කරුවන් ආපසු නොගෙවන රු. 500.00ක මුදලක් දුම්රිය සාමාන්‍යාධිකාරි නමට මහජන බැංකුවේ ගිණුම් අංක 176-1-001-2-9027313 දරන ගිණුමට බැරකර ලබාගන්නා ලද රිසිට්පත අයදුම්පත සමග අමුණා එවිය යුතු ය. වෙනත් ක්‍රමවලින් විභාග ගාස්තු ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත. අසම්පූර්ණ හෝ අවිධිමත් අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය විභාග මධ්‍යස්ථානයේ දී තහවුරු කළ යුතු ය.

11. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

යතුරු ලියන කඩදාසි ප්‍රමාණයේ (ඒ-4) අයදුම්කරුවා විසින්ම අයදුම්පත් සකස්කරගත යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ "උප දුම්රිය ස්ථානාධිපති විභාග අයදුම්පත්‍රය - ඉල්ලුම් කරන දුම්රිය ස්ථානය ........................ " යනුවෙන් සඳහන් කර දුම්රිය සාමාන්‍යාධිකාරි තැ.පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, කොළඹ 10 යන ලිපිනයට 2018.01.29 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (ආදර්ශ අයදුම්පත්‍රය පහත පරිදි වේ.)

12. අයදුම්පත සහතික කිරීම :

ඉල්ලුම්පත්‍රයේ ඇති අයදුම්කරුවාගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060.00 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.

එස්. එම්. අබේවික්‍රම,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

2017 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 10,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී.

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත උප දුම්රිය ස්ථානාධිපති තනතුරට ඉල්ලුම් කිරීම සඳහා වූ අයදුම්පත

අයදුම්කරන උප දුම්රිය ස්ථාන :- (සිංහලෙන්/දෙමළෙන්)
පළමු මනාපය :———.
දෙවන මනාපය :———.
තෙවන මනාපය :———.

අයදුම්කරන උප දුම්රිය ස්ථාන :- (ඉංග්‍රීසියෙන්)
පළමු මනාපය :———.
දෙවන මනාපය :———.
තෙවන මනාපය :———.

01. I. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
II. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :————.
III. මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
IV. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :————.

02. ස්ථිර ලිපිනය :
I. සිංහලෙන්/දෙමළෙන් :————.
II. ඉංග්‍රීසියෙන් :————.
III. දුරකථන අංකය (නිවස) :————. ජංගම :————.

03. I. උපන් දිනය :

අවුරුද්ද : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය :

2018.01.29 දිනට (අයදුම්පත් කැඳවන අවසන් දිනට) වයස :

අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

II. උස :————.

III. පපුව :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

05. දිස්ත්‍රික්කය :

(සිංහලෙන්/දෙමළෙන්) : ☐ ඉංග්‍රීසියෙන් : ☐

06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ග්‍රාම නිළාධාරී කොට්ඨාසය :

(සිංහලෙන්/දෙමළෙන්) ☐ (සිංහලෙන්/දෙමළෙන් ☐

(ඉංග්‍රීසියෙන්) ☐ (ඉංග්‍රීසියෙන්) ☐

07. ඔබගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඔබ ඉල්ලුම් කරන උප දුම්රිය ස්ථානයන්ට ඇති දුර ප්‍රමාණය (ඍජු දුර) කි.මී. වලින් දක්වන්න.

| උප දුම්රිය ස්ථානය | දුර ප්‍රමාණය (කි.මී.) |
|---|---|
| | |
| | |
| | |

08. අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සා/පෙළ)

| වර්ෂය හා විභාග අංකය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෙනත් සුදුසුකම් :————.

10. ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : (සිංහල/දෙමළ) ☐

11. ඔබ කිසියම් චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

12. ........................ දින මහජන බැංකුවේ .................. ශාඛාවට රු. 500.00 ක් ගෙවා ලබාගත් මුදල් බැරපතෙහි මුල් පිටපත මේ සමඟ අමුණා එවමි.
(වෙනත් ක්‍රමවලින් විභාග ගාස්තු ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.)

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික වෙමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය හා වැරදි සහගත බව මා පත්කරනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවටත් පත්වීම් ලැබීමෙන් පසුව අනාවරණය වුවහොත් මගේ සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන, ජාතික හැඳුනුම්පත් අංක ............ දරන .................. මහතා මා පෞද්ගලිකව දන්නා බවත් ඔහු අද දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිළධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිළ මුද්‍රාව තබන්න)

12-933

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.